# වැවිලි අමාත්‍යාංශය
# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය
# තේ පර්යේෂණ මණ්ඩලය

# පුරප්පාඩු

තලවාකැලේ, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ පවතින පහත සඳහන් තනතුරු පුරප්පාඩුව සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙතින් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

## 01. ජාලකරණ පද්ධති පරිපාලක :

**රැකියා විස්තරය**

ආයතනයේ තොරතුරු තාක්ෂණය (IT) යටිතල පහසුකම් ව්‍යුහය ඵලදායී ලෙස නඩත්තු කිරීම හා කළමනාකරණය සහ කාර්ය මණ්ඩලයට ඵලදායී සේවාවක් සැපයීමෙහිලා ක්‍රියා කිරීම. අධ්‍යක්ෂක, නියෝජ්‍ය අධ්‍යක්ෂක (පර්යේෂණ / ව්‍යාප්ති) සහ අදාළ අං / දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මග පෙන්වීම යටතේ ආයතනයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.

**සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අපේක්ෂකයින් :**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධිය සමග පුළුල් ප්‍රදේශ ජාල පද්ධති පරිගණක වාතාවරණයන් කළමනාකරණය, අන්තර්ජාලය තුළින් දත්ත සමුදාය කළමනාකරණය සහ පද්ධති ප්‍රොටෝකෝල (චර්යා විධි) ක්‍රියාත්මක කිරීම හා වෙබ් අඩවි යනාදිය පිළිබඳ අවම තරමින් වසර තුනක (03) පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත් ප්‍රථම උපාධිය සහ පුළුල් ප්‍රදේශ ජාල පද්ධති පරිගණක වාතාවරණයන් කළමනාකරණය, අන්තර්ජාලය තුළින් දත්ත සමුදාය කළමනාකරණය සහ පද්ධති ප්‍රොටෝකෝල (චර්යා විධි) ක්‍රියාත්මක කිරීම හා වෙබ් අඩවි යනාදිය පිළිබඳ අවම තරමින් වසර පහක (05) පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

**සටහන :**

වෙබ් යෙදවුම් සංවර්ධන පිළිබඳ පළපුරුද්ද සහ සම්මත මෘදුකාංග පැකේජ පිළිබඳ මනා දැනුම අමතර සුදුසුකමක් වනු ඇත.

**වැටුප් පරිමාණය :**

MM 1-2 (2016) රු. 54,550 - 10 x 1,375 - 15x1,910 - රු. 96,950 (මාසික)

**වයස :**

අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. මෙම උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින් හට බලනොපානු ඇත.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**වෙනත් ප්‍රතිලාභ :**

(i) (ඇත්නම්) නවාතැන් පහසුකම් (පූර්ණ ගෘහ භාණ්ඩ සහිත නිල නිවාස / නේවාසිකාගාර කාමර) සපයනු ලබන අතර, නොඑසේනම් නවාතැන් පහසුකම් වෙනුවට දීමනාවක්ද ගෙවනු ලැබේ.

(ii) ආයතනයේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයේ පවතින නීති රීතිවලට අනුකූලව වෛද්‍ය ප්‍රතිලාභ හිමිවනු ඇත.

(iii) ආයතනයේ මාර්ගෝපදේශවලට අනුව හදිසි වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා නොමිලේ ප්‍රවාහන පහසුකම් සපයනු ලැබේ.

(iv) සෑම සති අන්තයකම තලවාකැලේ ශාන්ත කූම්බ්ස් සිට මහනුවර සහ කොළඹ දක්වා ප්‍රවාහන පහසුකම් ලබා දෙනු ලැබේ.

(v) **අර්ථ සාධක අරමුදල (PF)** තෝරාගනු ලබන අපේක්ෂකයා විසින් කාර්ය මාණ්ඩලික අර්ථ සාධක අරමුදලට වැටුපෙන් 10% ක් වශයෙන්ද ආයතනය විසින් 15% ක් වන දායකත්වයක් ද එම අරමුදලට දායකත්ව සපයනු ලැබේ. තවද, ආයතනය විසින් සේවා නියුක්තයින්ගේ භාර අරමුදලට (ETF) 3% ක දායකත්වයක් ලබා දෙනු ලැබේ.

(vi) තේ පර්යේෂණ ආයතනයේ (TRI) හි සේවක සේවිකාවන් හට අදාළ වන වෙනත් ආන්තික ප්‍රතිලාභද හිමිවනු ඇත.

මෙම තනතුර ස්ථිර තනතුරක් වනු ඇත. අයදුම්පත් සම්පූර්ණ ජීව දත්ත අයදුම්පත් සමග උප්පැන්න සහතිකයේ පිටපතක්, අදාළ අධ්‍යාපනික සහ වෙනත් අදාළ වෘත්තීයවේදී සුදුසුකම් පිළිබඳ සහතික වල පිටපත්ද සමග අදාළ ක්ෂේත්‍රයේ අයදුම්කරුගේ කුසලතා හා දැනුම පිළිබඳ සාක්ෂ්‍ය කළ හැකි ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනද සමග අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර 2020 නොවැම්බර් මස 23 වනදින හෝ ඊට පෙර ලැබෙනසේ පහත සඳහන් වනු ලබන ලිපිනයට ලැබෙන සේ ලේඛනගත (ලියාපදිංචි) තැපෑලෙන් එවිය යුතුය.

රජයේ සේවයේ / රාජ්‍ය සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ දැනටමත් නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු වන අතර, මෙම අවශ්‍යතාවයට අනුකූල නොවන පරිදි ඉදිරිපත් කරනු ලබන සියලු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබීමට භාජනය වනු ඇත. තවද, අයදුම්පත් බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර පැහැදිලිව සටහන් කළ යුතුය.

වැඩිදුර තොරතුරු ලබාගැනීම සඳහා තේ පර්යේෂණ ආයතනයේ වෙබ් අඩවිය වන www.tri.lk වෙත පිවිසෙනු මැනවි.

**අධ්‍යක්ෂක,**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**ශාන්ත කූම්බ්ස් (Coombs), තලවාකැලේ.**
**2020.10.23 වන දින දිය.**